## ගැරඬිගල පුරාණ විහාරය - ගලේවෙල



මෙම විහාරස්ථානය අනුරාධපුර යුගයේ රජ කළ තුන්වන කාශ්‍යප රජු විසින් ඉදිකළ බවට විශ්වාස කෙරේ. මෙම විහාරස්ථානයේ පෞරාණික නෂ්ඨාවශේෂ අතර දාගැබක්, විහාර මන්දිරයක් හා දෙවොලක් ද හමුවී තිබේ. මෙහි විශාල ගල් ලෙන් හතරක් ද ඉන් එක් ලෙනක ගල් ඇඳන් අටක් පමණ ද දක්නට ලැබේ. එසේම ඓතිහාසික ගැරඬිගල සෙල් ලිපියේ ඇති විශේෂත්වය නම් බල්ලෙකු හා කපුටෙකු කොටා ඇති ලංකාවේ එකම සෙල් ලිපිය මෙය වීමයි.

## ඉබ්බන්කටුව පුරාණ සොහොන් බිම - ගලේවෙල



ගලේවෙල පිහිටි මෙය කිතු වසරටත් පෙර තතු හෙළිකරන ඉබ්බන්කටුව සුසාන භූමිය කුඩා ගල් පතුරු සතරක් සතර දිශාවේ ආවරණය කොට ඒ මත විශාල ශිලා ඵලකයක් තැම්පත් කොට සංවෘත කුටියක් ලෙස සකස් කල සුසාන භූමියකි. මෙහි කුවේණිය ඇතුළු ඇයගේ ආදිවාසීන් ආදාහනය කළ බවට ඉතිහාසයේ සඳහන් වේ.

සංචාරක ආකර්ශන ස්ථානයන් සම්බන්ධව
කඳුරට ගුවන් විදුලි සේවයේ 107.5, 90.1, 107.3
ඔස්සේ දිනපතා
පෙ.ව. 6.40 ට විකාශය වන
"තොටුපොළ මංපෙත්"
වාර්තාමය වැඩසටහනට සවන් දෙන්න.

## වහකෝට්ටේ ශාන්ත අන්තෝනි දේවස්ථානය ගලේවෙල



මෙය ස්වභාවික සෞන්දර්යයන්ගෙන් ආරූඪ වූ ගලේවෙල ප්‍රදේශයේ රමණීය කඳුකරයක පිහිටා ඇත. මෙම දෙව් මැදුර කලූකුමාරාණන්ගේ දෙව් මැදුර ලෙසද හඳුන්වයි. පල්ලියේ ආරම්භය සිදුවී ඇත්තේ ජුසේවාස් නම් පියතුමෙකුගෙනි. මේ සඳහා විමලධර්මසූරිය රජුගේ අනුග්‍රහයද ලැබී ඇත.

## ශ්‍රී පාදය



අඹගමුව කෝරළයට අයත් ශ්‍රී පාදස්ථානය වන්දනා කිරීම දෙසැම්බර් උඳුවප් පෝය දිනට පෙර දිනයෙන් ආරම්භ වන අතර වෙසක් පෝය දිනට පෙර දිනයෙන් අවසන් වේ. බුදුන් වහන්සේගේ වම් ශ්‍රී පාද ලංඡනය මෙහි පිහිටුවා ඇත්තේ සමන් දෙවියන්ගේ ආරාධනාවකට අනුව බව දීපවංශයේ හා සමන්තපාසාදිකාවෙහි දැක්වේ. ශ්‍රී පාද ලාංඡනය මීටර් 1.8 ක දිගකින් යුක්ත වේ.

## නිලන්ද සොහොන - අඹගමුව කෝරළේ



මෙය අඹගමුව කොත්තැල්ලෙන ගමෙහි පිහිටා ඇත. 1974 දෙසැම්බර් මස සයිබීරියාවේ සිට මගීන් 182 රැගෙන හජ්ජි වන්දනාවට සහභාගී වීම සඳහා ගමන් ගත් ගුවන් යානය අනතුරට පත් වූ අතර එහි ගමන් ගත් මගීන් ස්මරණය සඳහා මෙම සොහොන ඉදි කර ඇත. මෙම අනතුර සිදුවූ වර්ෂය හා එම පුවත සඳහන් ගල් පුවරුවක් මෙහි ඉදිකර තිබේ.

## අඹගමුව සෙල් ලිපිය - අඹගමුව කෝරළේ



මෙය පළමු විජයබාහු රජු විසින් ගල් තලා දෙකක කොටා ඇති අතර එහි එම රජුගේ වීර වික්‍රමාන්විතයන් හා ලංකාව එක්සේසත් කළ විස්තරත් ශ්‍රී පාදස්ථානය වැඳ පුදා ගත් විස්තර හා පුදපූජා පිළිබඳ විස්තරත් මෙහි දැක්වේ. මෙය මධ්‍යකාලීන සිංහල අක්ෂර වලින් යුක්ත වේ.

# වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව

### මධ්‍යම පළාත




වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව
අංක 1054, ගැටඹේ, පේරාදෙණිය.
දුරකථන / ෆැක්ස් : 081 - 2387118
ඊමේල් : tradecomtourcpc@gmail.com
වෙබ් අඩවිය : www.tourism.cp.gov.lk

## දෙගල්දොරුව රජ මහා විහාරය - කුණ්ඩසාලේ





1747 - 1780 දක්වා රජ කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ආරම්භ කළ මෙම විහාරයේ වැඩ අවසන් කර ඇත්තේ 1781 රජ වූ ඔහුගේ බාල සොහොයුරු රාජාධිරාජසිංහ රජු විසිනි. විහාරස්ථානයේ ශේෂ වී ඇති සිතුවම් වලින් ජාතක කතා විදහාපාන චිත්‍ර සමූහයක්ද, සුවිශේෂී ලක්ෂණ වලින් යුත් මාර පරාජය චිත්‍රයද, මගී කාන්තාවගේ රුවද, පරසතු මලෙහි චිත්‍රයද දැකගත හැක.

## ගල්මඩුව රජමහා විහාරය - කුණ්ඩසාලේ





හින්දු වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ප්‍රබල ලෙස මූර්තිමත් කරන ගලින් කරන ලද මඩුවක ඉදිකළ මෙම විහාරස්ථානය 1740 දී පමණ කරවා ඇත. මෙම ශෛලමය ගොඩනැගිල්ල අපූරු ගෘහ නිර්මාණාත්මක ස්වභාවයක් උසුලන අතර එහි පහත මාලය ශෛලමය නිමාවක් සහිත වන අතර ගඩොලින් සහ කළුගලින් ගොඩනැගූ ඉහළ කොටස් හතරවෙනි මහල තෙක් ක්‍රමයෙන් කුඩා වෙමින් ගොස් විමාන ස්වරූපයක් ගනී.

## හසලක ගුරුළුපොත සීතා කොටුව





පුරාවෘත්තයන්ට අනුව රාම රාවණා කථා පුවත තුළ රාවණා රජු විසින් සීතා දේවිය සැඟවූ ස්ථානයක් ලෙස මෙම ස්ථානය සැලකේ. ඓතිහාසික ගුරුළුපොත බෝ මළුව විහාරස්ථානය ආශිර්වාද පූජාවන් සඳහා බෞද්ධයන් අතර ප්‍රසිද්ධියක්ද උසුලයි. මීට අමතරව මේ ප්‍රදේශය පිහිටා ඇති වික්ටෝරියා, රන්දෙණිගල, රංටැඹේ රක්ෂිත තුළ විවිධ පාරිසරික පද්ධති, ඉහළ ජෛව විවිධත්වයන් රාශියක් හඳුනා ගතහැකි අතරමැදි කලාපීය දේශගුණික ලක්ෂණ පෙන්නුම් කරනු ලබන ස්ථානයකි.

## උඩදුම්බර වෙඩිලුණු ගල්ලෙන





උඩුදුම්බර කුඹුක්ගොල්ල ගමෙහි පිහිටා ඇති මෙය දීර්ඝ කාලීනව අවසානය වූ පොටෑසියම් නයිට්‍රේට වලින් සැදි ගුහාවකි. මෙය විශාල ගුහාවක් වන අතර අඩි 200 ක් පමණ ගැඹුරුය. ගුහා කට අර්ධ කවාකාර වන අතර අඩි 8 ක් උසය. අඩි 100 ක් පළලය. ගුහාවේ භූමිය මාබල් වලින් නිර්මාණය වී ඇති අතර මහනුවර රජයේ යුද්ධ කටයුතු වලදී භාවිතා කිරීම සඳහා අවශ්‍ය වෙඩිලුණු සපයන්නට ඇත්තේ මෙයින් බව විශ්වාස කෙරේ.

## උඩදුම්බර යහන්ගල



පෞරාණික හා ස්වභාව ධර්මයේ චමත්කාරයෙන් හෙබි ප්‍රදේශයක් ලෙස යහන්ගල කන්ද මැදගත් වේ. මෙහි සංචාරය කරන්නෙකුට කලුගල තලගුනේ ප්‍රදේශයේ දුම්බර රටා නිෂ්පාදයන්ද දැක ගත හැක. කන්දක් මත පිහිටි තවත් සොඳුරු කඳු මුදුනක් වන මෙය මෙහි සිට බලන විට වියළි කලාපයේ තැනිතලා ප්‍රදේශ ඉතාමත් සොඳුරුව දිස්වේ. එසේම වල් අලි ක්‍රියාකාරකම් පහසුවෙන් දැකගත හැකි ප්‍රදේශයකි. රාවණා රජු විසින් සීතා කුමරිය සඟවා තැබුවේ යැයි කියන මෙම කන්ද මත ඒ සම්බන්ධ ගල් ගුහා කීපයක් පිහිටා ඇති බව ජනවහරෙහි සඳහන් වේ.

## මාතලේ අළු විහාරය









අළු විහාරයේ ඇත ලෙන් විහාරය ත්‍රිපිඨකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා යොදා ගන්නා ලද ප්‍රධාන ලෙන් සංකීර්ණයයි. ක්‍රි:පූ: 1 වැනි සියවසේ දී වළගම්බා රජු කුන්තගත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පන්සියයක් රහතන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් එතෙක් මහ රහතන් වහන්සේලා විසින් භාණක පරම්පරා 38 ක් යටතේ මුඛ පරම්පරාවෙන් සුරක්ෂිත කර ගත් ත්‍රිපිඨක ධර්මය, ධර්ම සංගායනාවක් පවත්වා තල්පත් වල හෙළ බසින් මාතලේ අළු විහාරයේ දී ග්‍රන්ථාරූඪ කරන ලදී. මෙහි කටාරම් කෙටූ ස්වභාවික ගල්ලෙන් සංඛ්‍යාව 11 කි.

## මාතලේ ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිල



මාතලේ නගර මධ්‍යයේ පිහිටා ඇති මෙය 1824 - 1884 කාලයේ ඉන්දියාවෙන් පැමිණි දෙමළ ජනතාවට ශ්‍රී මුත්තුමාරි අම්මාන් දෙවියන් පිදීම උදෙසා ඉදි කොට ඇත. මෙහි ඉතා මනරම් චිත්‍ර මෙන්ම මූර්ති ද ගොඩ නඟා ඇත.

## නාලන්ද ගෙඩිගේ - නාඋල











මෙම සිද්ධස්ථානය තනි කළු ගලින් නිර්මාණය කර ඇත. හින්දු සහ බෞද්ධ ආගමික සංකලනයක් වශයෙන් සිංහල හා පල්ලව වාස්තු විද්‍යා ක්‍රමයන්ගෙන් යුක්ත වූ ලංකාවේ ඉදිවුණු ප්‍රථම හා එකම සිද්ධස්ථානය මෙය වේ. මෙහි කරන ලද කැණීම් වලින් දකුණු ඉන්දියානු පල්ලව සම්ප්‍රදායේ බලපෑම මඟින් කරන ලද විවිධ කැටයම් දක්නට ඇත.